# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.14 පැය 1515 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 63 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද වියළි කහ සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම සම්බන්ධ වැඩිදුර වාතර්ාව - දුන්ගල්පිටිය පොලිස් ස්ථානය.**

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව, 2025.01.12 වන දින රාත්‍රී කාලයේ දුන්ගල්පිටිය පොලිස් වසමේ සෙත්තපප්පාඩුව ප්‍රදේශයේදී දුන්ගල්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මුහුදු මාගර්යෙන් තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද වියළි කහ අඩංගු උර 101 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ලොරි රථයද පොලිස් භාරයට ගෙන තිබිණි.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 44 හා 47 යන වයස්වල පසුවන උතුරු පිටිපන හා සෙත්තපප්පාඩුව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙහි, වියළි කහ කිලෝ ග්‍රෑම් 3947 ග්‍රෑම් 900 ක් අඩංගුව තිබූ අතර සැකකරුවන් මීගමුව ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2025.01.27 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

දුන්ගල්පිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.